# මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය (PL – 03 – 2006 (A) සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 මගින් හඳුන්වා දී ඇති නව වැටුප් ප්‍රතිපත්තියට අනුකූලව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය PL – 03 – 2006 (A) සඳහා වන මෙම පරිපාටිය, මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මේ දක්වා ක්‍රියාත්මක වූ මෙම සේවයට අදාළ තනතුරු වල බඳවා ගැනීමේ / උසස් කිරීම් පරිපාටින්ට අගතියක් නොවන පරිදි ක්‍රියාත්මක වේ.

**01. සම්බන්ධ වන ආයතනය**

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | : යොමු අංකය .සීපීසී/පීඩීඑච්එස්/පී/01/04/2013 | දිනය: 2014.03.03 |
| 1.2 | අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය | : යොමු අංකය සීපීසී/එච්එම්/එච්ආර්/11/13-21 | දිනය: 2014.03.13 |
| 1.3 | ප්‍රධාන ලේකම්ගේ : නිර්දේශය | : යොමු අංකය සීපීසී/සීඑස්/2/3/එස්එම්/එච්(1) | දිනය: 2014.03.17 |
| 1.4 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය | : යොමු අංකය ඩීඑම්එස්/ඩී/පොදු/11-2 | දිනය: 2012.12.19 |
| 1.5 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | : යොමු අංකය: සීපීසී/පීඑස්සී/9/1/19/2014 | දිනය: 2014.09.02 |

**02. පත් කිරීමේ බලධරයා පිළිබඳ විස්තර** : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම්

**03.** 3.1 සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය

3.2 ශ්‍රේණි : III, II, I සහ විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වා ගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවයන් වන ඉදිකිරීම්, නඩත්තු හා අලුත් වැඩියා, ආලෝකකරණ වැනි මූලික කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) හතර (04) වැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක් / ප්‍රවීණතා සහතිකයක් මගින් තහවුරු කෙරෙන කාර්මික/ ශිල්පීය / වෘත්තීය කුසලතාවයන් අවශ්‍ය වන කාර්යයන් පවරනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක සේවකයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

04. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලකට දායක විය යුතුය.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : PL – 03 – 2006 (A)

5.2 වැටුප් පරිමාණය : රු.12,470-10X130-10X145-10 X160-12X170-18,860.00

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය(රුපියල්) |
|---|---|---|
| III | පියවර 01 | රු-12.470 .00 |
| II | පියවර 12 | රු-13,915 .00 |
| I | පියවර 22 | රු-15,380 .00 |
| විශේෂ | පියවර 32 | රු-16,990 .00 |

06. සේවා ගණයට අයත් තනතුරු /තනතුර

6.1 අනුමත තනතුරු නාම හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | අනුමත සේවක සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| 1. විදුලි කාර්මික | 13 | • ආයතනයේ විදුලි උපකරණ සවි කිරීම. අළුත්වැඩියා කිරීම ,විදුලි ඒකක වල /යන්ත්‍ර වල දෝෂ හඳුනාගෙන අවශ්‍ය කටයුතු කිරීම.<br>• විදුලි රැහැන් ඇදීම ,ව්‍යාප්ත කිරීම සැලසුම් කිරීම , ගොඩනැගිලිවල විදුලි අළුත්වැඩියා කිරීම.<br>• ආයතන / අංශ ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම. |
| 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික | 04 | • ආයතනයේ වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කටයුතු වල තම වෘත්තියට අදාළ අළුත්වැඩියාවන් ඉටු කිරීම.<br>• තමා භාරයේ ඇති යන්ත්‍ර උපකරණ හා මෙවලම් වල වගකීම් දැරීම.<br>• නියෝග කරනු ලබන පරිදි රජයේ වෛද්‍ය ආයතන වල වෛද්‍ය උපකරණ අළුත්වැඩියාව.<br>• ආයතන / අදාළ අංශ ප්‍රධානියා විසින් ඔවුන් වෙත පවරනු ලබන කවර හෝ රාජකාරියක් නොපිරිහෙලා ඉටු කළ යුතුය. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III,II,I හා විශේෂ ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.

07. බඳවා ගැනීම.

7.1 බඳවා ගැනීමේ අනුපාතය :

(අ.) 1. විදුලි වෛද්‍ය යාන්ත්‍රික 2. විදුලි කාර්මික

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50% |
| සීමිත | 50% |
| කුසලතා | අදාළ නොවේ |



ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

## 7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :
7.2.2.2 වෘත්තිය සුදුසුකම් :
7.2.2.3 පළපුරුද්ද :
7.2.2.4 කායික සුදුසුකම් :
7.2.2.5 වෙනත් :

} එක් එක් තනතුරට අදාළ සුදුසුකම් ඇමුණුම 01

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 (රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

1 විදුලි වෛද්‍ය යාන්ත්‍රික
2 විදුලි කාර්මික

| විෂයයන් | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානු බද්ධ සාමාන්‍ය දැනීම | 100 | 40% |

ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු වල සහ ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : ඇමුණුම - 02

7.2.4.1.1 පවත්වන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය : ඇමුණුම - 03

අ. 1 විදුලි කාර්මික 2.විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තනතුරට අදාළ දැනුම පිළිබද පරීක්ෂණය | 100 | 40% |

7.2.4.2.1 පවත්වන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරන ආයතනයක් මගින්

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

7.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා : අදාළ නොවේ

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ) :
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : කායික යෝග්‍යතාවය හා සුදුසුකම් පරීක්ෂා කිරීම

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධාරියා :
මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම් පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම:

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III වන ශ්‍රේණිය
7.3.2 සුදුසුකම්:

7.3 2.1.අධ්‍යාපන සුදුසුකම් :
7.3.2.2 වෘත්තිය සුදුසකම් :
7.3.2.3 පළපුරුද්ද :
7.3.2.4 කායික සුදුසුකම් :
7.3.2.5 වෙනත් :
} එක් එක් තනතුරට අදාළ සුදුසුකම් ඇමුණුම - 04

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) 1.විදුලි කාර්මික
2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදි ලබා ගත් ලකුණු සහ ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයේදි ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනු පිළිවෙලට බඳවා ගනු ලැබේ.

7.3.3.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.3.3.1.1 පවත්වන බලධරයා : අදාළ නොවේ.

7.3.3.2 වෘත්තිය පරීක්ෂණය : ඇමුණුම 05

(අ) 1.විදුලි කාර්මික 2.විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තනතුරට අදාළ විෂය දැනුම | 100 | 40% |

7.3.3.2.1 පවත්වන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරන ආයතනයක් මගින්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

7.3.3.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.3.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ඇමුණුම 06

අ. 1.විදුලි කාර්මික 2.විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨත්වය<br>2.අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>3.තනතුරට අදාළ පළපුරුද්ද<br>4.සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 40<br>35<br>20<br>05 | 40% |

7.3.3.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

7.3.4 අයදුම්පත් කැදවීමේ ක්‍රමය : දෙපාර්තමේන්තු පොදු චක්‍රලේඛයක් මගින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින්

7.4 කුසලතාවය මත බදවා ගැනීම : අදාළ නොවේ.

## 08.කාර්යක්ෂමතා කඩඉම්.

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමන වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත/වෘත්තිය/සහතික පාඨමාලා /වෙනත්) |
|---|---|---|
| 01 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බදවා ගෙන වසර තුන(3) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 07) |
| 02. වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට පත්වී වසර තුන(3) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 08) |
| 03. වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට පත්වී වසර පහ(5) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 09) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද: වසරකට දෙවරක්

8.3 විභාගය පවත්වන බලධාරීන් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරන ආයතනයක් මගින්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයින් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| 2.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 - III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

### 10.2 - II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයෙහි II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

### 10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

#### 10.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

##### 10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම.

10.3.2 **උසස් කිරීමේ ක්‍රමය :** සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. සේවයේ යෙදී සිටින සේවකයින් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම 10 හි දැක්වේ.

13. පාලනය : සේවාව තනතුරු / මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පාලනයට යටත් වේ.

14. පොදු කොන්දේසි : I. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියළුම පත් කිරීම් / බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.
II. බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි, කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන විධිවිධානද අදාළ වේ.

**15.** අයතන සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ හා නිර්වචන. :

i. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ "ආණ්ඩුකාරවරයා" යනු මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා වේ.

ii. "කොමිෂන් සභාව" යනු මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

iii. "පත්වීම් බලධාරියා" යනු මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

iv. "ලේකම්වරයා" යන්නෙන් මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

v. "බඳවා ගැනීමේ පරිපාටිය" යනු මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයට (PL-03-2006(A) අදාළ පරිපාටිය වේ.

vi. "සේවය" යනු මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවය වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

vii "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

viii "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින්ද සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබේ.

17. 2014.09.02 දිනැති කොමිෂන් සභා රැස්වීම් දිනයේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

| | නම | | අත්සන |
|---|---|---|---|
| 01 | එස්.බී. බැද්දේවෙල මහතා | (සභාපති) | ........................ |
| 02 | යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ........................ |
| 03 | ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය | (සාමාජික) | ........................ |
| 04 | වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................ |
| 05 | ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ........................ |

18. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

අනුමත කරමි / නොකරමි

........................................

ටිකිරි කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20......................

ඇමුණුම - 01

ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL -3 -2006 A) III වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු වල
විවෘත බඳවා ගැනීම් සඳහා අදාළ වන සුදුසුකම් (7.2.2 ඡේදය)

| තනතුර | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| 1.විදුලිකාර්මික | I අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.<br><br>II වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>III පළපුරුද්ද : අදාළ නොවේ.<br><br>IV කායික සුදුසකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>V වෙනත් :<br>1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.<br>2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>4. මෙම තනතුර සඳහා අයදුම් කල හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |
| 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික | I අධ්‍යාපන සුදුසුකම්: අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.<br><br>II වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>III පළපුරුද්ද : අදාළ නොවේ<br><br>IV කායික සුදුසකම්: සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>V වෙනත් :<br>1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.<br>2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>4. මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

-ඇමුණුම -02

ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL -3 -2006 A) III වැනි ශ්‍රේණියේ (විවෘත)
බඳවා ගැනීම් සඳහා වූ අදාළ තනතුරුවල ලිඛිත විභාගය (7.2.4.1 ඡේදය)

1. විභාගය පිළිබඳ විස්තර

(අ) 1. විදුලි කාර්මික 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | පැය 01 1/2 | 100 | 40% |

2. පවත්වන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පිරවීමට අවශ්‍ය වූ අවස්ථාවලදී

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

(අ) 1 විදුලි කාර්මික 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය හා ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සම්බන්ධතා වටහා ගැනීමේලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම. | තනතුරට අදාළ රාජකාරි පිළිබඳ කරුණු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම -03

ප්‍රාථමික ශිල්පිය සේවා ගණය (PL -3 -2006 A) III වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු වල (විවෘත) බඳවා ගැනීම් සඳහා වෘත්තිය පරික්ෂණය (7.2.4.2 ඡේදය)

1. විභාගය පිළිබඳ විස්තර

(අ) 1 විදුලි කාර්මික 2 විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම පිළිබද දැනුම, අදාළ ක්ෂේත්‍රයේ උපකරණ වල දෝෂ හදුනා ගැනීම, ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබද දැනුම | විනාඩි 30 | 100 | 40% |

2. විභාගය පවත්වනු ලබන බලධාරියා: මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :පුරප්පාඩු පිරවීමට අවශ්‍ය වූ අවස්ථාවකදී

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 1.විදුලි කාර්මික විෂය දැනුම | විදුලි උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම. විදුලි ඒකකවල / යන්ත්‍රවල දෝෂ , විදුලි රැහැන් ඇදීම, ව්‍යාප්ත කිරීම, සැලසුම් කිරීම, ගොඩනැගිලිවල විදුලිය අළුත් වැඩියා කිරීම. |
| 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික | 1:16 පරිමාණයක් කියවීම, විදුලි වයරින් කිරීම, සාමාන්‍ය විදුලි උපකරණ අලුත් වැඩියා කිරීම, සරල රියම් පැස්සීම් කිරීම, සවි කිරීම (Fit) කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම

## ඇමුණුම -04

**ප්‍රාථමික ශිල්පිය සේවා ගණය (PL -3 -2006 A) III වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු වල සීමිත බඳවා ගැනීම් සඳහා අදාළ වන සුදුසුකම්. (7.3.2 ඡේදය)**

| තනතුර | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| 1.විදුලි කාර්මික | I අධ්‍යාපන සුදුසුකම්: අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.<br><br>II වෘත්තිය සුදුසුකම් : I ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පිය නොවන සහ අර්ධ ශිල්පිය තනතුරක අවම වශයෙන් අවුරුදු 05කට නොඅඩු අඛණ්ඩ සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම හෝ ප්‍රාථමික ශිල්පිය සේවා ගණයේ තනතුරක වසර 03 කට නොඅඩු අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් තිබීම.<br><br>II තනතුරට අදාළව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය සුදුසුකම් සහතික 4 වන මට්ටමට (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>III පළපුරුද්ද 1. රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් තනතුරට අදාළ රාජකාරි පිළිබද අවුරුදු 05ක පළපුරුද්දක් තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)<br>2. විදුලි රැහැන් ඇදීම, සැලසුම් කිරීම පිළිබද අවබෝධයක් ,තිබීම.<br>3. ගොඩනැගිලිවල විදුලි අළුත්වැඩියා කිරීමට හැකියාව තිබීම.<br>4. මෝටර් රථ විදුලි කාර්මික අළුත්වැඩියාව පිළිබද දැනුමැති හැකියාව තිබීම.<br><br>IV කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>V වෙනත් : 1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.<br>2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>3. තනතුරට බඳවා ගැනීම සදහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සදහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>4. මෙම තනතුර සදහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |
| 2.විදුලි වෛද්‍ය යාන්ත්‍රික | I අධ්‍යාපන සුදුසුකම්: අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.<br><br>II වෘත්තිය සුදුසුකම් : ප්‍රාථමික ශ්‍රේණියේ (ශිල්පිය නොවන) සහ අර්ධ ශිල්පිය තනතුරක අවම වශයෙන් අවුරුදු 05කට නොඅඩු අඛණ්ඩ සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම හෝ ප්‍රාථමික ශිල්පිය සේවක ගණයේ තනතුරක වසර 05 නොඅඩු අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් තිබීම.<br><br>III පළපුරුද්ද : රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයකින් තනතුරට අදාළ රාජකාරි පිළිබද අවුරුදු 03ක පළපුරුද්දක් තිබීම.(සහතික මගින් සනාථ කළ යුතුය.)<br>• 1:16 පරිමාණයක් කියවීමට හැකි වීම.<br>• විදුලි වයරින් කිරීම පිළිබදව මූලික දැනීමක් තිබීම..<br>• සාමාන්‍ය විදුලි උපකරණ අලුත් වැඩියා කිරීමටත් දැනුමක් තිබීම.<br>• සරල ඊයම් පැස්සීම් හැකියාව තිබීම.<br>• සවි කිරීම (Fit) කිරීම පිළිබද මූලික දැනීමක් තිබීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම්

| | |
|---|---|
| | IV කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>V වෙනත් : 1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.<br>2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>4. මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |

## ඇමුණුම -05

ප්‍රාථමික ශිල්පිය සේවා ගණය (PL -3 -2006 A) III වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු වල සීමිත බඳවා ගැනීම් සඳහා අදාළ වන වෘත්තිය පරීක්ෂණය (7.3.3.2 ඡේදය)

1. විභාගය පිළිබඳ විස්තර

    (අ) 1විදුලි කාර්මික 2.විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම, උපකරණ සවි කිරීම, අළුත් වැඩියා කිරීම පිළි බඳ දැනුම, අදාළ ක්ෂේත්‍රයේ උපකරණ වල දෝෂ හඳුනා ගැනීම, ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම. | විනාඩි 30 | 100 | 40% |

2. විභාගය පවත්වන බලධාරිය : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පිරවීමට අවශ්‍ය වූ අවස්ථාවකදී.

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 1. විදුලි කාර්මික විෂය දැනුම | විදුලි උපකරණ සවි කිරීම, අළුත් වැඩියා කිරීම, විදුලි ඒකකවල /යන්ත්‍ර වල දෝෂ , විදුලි රැහැන් ඇදීම, ව්‍යාප්ත කිරීම, සැලසුම් කිරීම, ගොඩනැගිලි වල විදුලිය අළුත් වැඩියා කිරීම. |
| 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික විෂය දැනුම | 1:16 පරිමාණයක් කියවීම. විදුලි වයරින් කිරීම, සාමාන්‍ය විදුලි උපකරණ අළුත් වැඩියා කිරීම , සරල ඊයම් පෑස්සීම් කිරීම, සවි කිරීම (Fit) කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

## ඇමුණුම -06

ප්‍රාථමික ශිල්පිය සේවා ගණය (PL -3 -2006 A) III වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු වල
සීමිත බඳවා ගැනීම් සඳහා වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (7.3.3.4 ඡේදය)

01. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර

I. ජ්‍යෙෂ්ඨත්වය- ලකුණු 40

අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් නොලබා ඇති හා වැටුප් වර්ධක නිසි පරිදි උපයාගෙන ඇති සතුටුදායක සේවා කාලයක් ඇති

සෑම වර්ෂයක් වෙනුවෙන්ම ලකුණු 04
මාස 12ට අඩු හා මාස 09ට වැඩි ලකුණු 03ක්ද
මාස 09ට අඩු හා මාස 06ට වැඩි ලකුණු 02ක්ද
මාස 06ට අඩු මාස 03ට වැඩි ලකුණු 01ක්ද වශයෙන් උපරිම ලකුණු 40 දෙනු ලැබේ.

සටහන - දඬුවම් ලබා ඇති වර්ෂ වෙනුවෙන් හා වැටුප් වර්ධක නිසි පරිදි උපයාගෙන නොමැති වර්ෂ වෙනුවෙන් ලකුණු හිමි නොවේ.

II. යෝජිත අධ්‍යාපන සුදුසුකම් වලට වඩා වැඩි අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලකුණු 35

(අ.) එකවර විෂයන් 06ක් සහිතව ලැබූ මූලික සුදුසුකම් වලට අමතරව අ.පො.ස. (සා.පෙ)/ ජා.අ.පො.ස. විභාගයේදි විෂයයන් සඳහා ලැබූ එක් සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලකුණු 01 බැගින්ද,
සම්මාන සාමාර්ථයක් සඳහා ලකුණු 02 බැගින් ද විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා ලකුණු 03 බැගින්ද උපරිම වශයෙන් විෂයයන් 06ක් සඳහා - 18

(ආ) අ.පො.ස.(සා.පෙ.)/.අ.පො.ස. විභාගයේදි ඉංග්‍රිසි විෂයය සමත්වීම සඳහා - 02

(ඇ) අ.පො.ස.(උ.පෙ.)විභාගයේදි එකවරකදි විෂයයන් 03ක් සමත්වීම සඳහා උපරිම - 15
විෂයයන් 02ක් වෙනුවෙන් ලකුණු 10
එක් විෂයක් වෙනුවෙන් ලකුණු 05

III. තනතුරට අදාළ පළපුරුද්ද ලකුණු 20

(අ.) රජයේ රෝහලක හෝ පෞද්ගලික ආයතනයක තනතුරට අදාළ දැනුම වසර 01 හෝ ඊට වැඩි කාලයක පලපුරුද්ද සඳහා වසරකට ලකුණු 02 බැගින්

IV. සම්මුඛ පරීක්ෂණයේදි දක්වනු ලබන කුසලතාවය ලකුණු 05

මුළු ලකුණු 100

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 07

ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL -3 -2006 A) III වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු සඳහා නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (8.1ඡේදය)

1 විභාග පිළිබඳ විස්තර

(අ ) 1.විදුලි කාර්මික 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | පැය 01 | 100 | 40% |

2.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

3.පවත්වනු ලබන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4 විෂය නිර්දේශය

(අ ) 1.විදුලි කාර්මික 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද<br>I සේවයට බඳවා ගැනීමේ කාර්යය පරිපාටිය<br>III මාරු කිරීම්<br>XII නිවාඩු<br>XIII දුම්රිය බලපත්‍ර<br>මුදල් රෙගුලාසි 90,101 සිට 105 දක්වා (ප්‍රශ්න 50කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි) |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 08

ප්‍රාථමික ශිල්පිය සේවා ගණය (PL -3 -2006 A) II වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු සඳහා නියමිත
දෙවන කර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (8.1 ඡේදය)

1 විභාග පිළිබඳ විස්තර

(අ ) 1.විදුලි කාර්මික 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | පැය 01 1/2 | 100 | 40% |

2.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

3.පවත්වනු ලබන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4. විෂය නිර්දේශය

(අ ) 1.විදුලි කාර්මික 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහයේ<br>XXI ආරක්ෂක ඇඳුම් හා නිල ඇඳුම්<br>XXII සුභ සාධන පහසුකම්<br>XXIII ඇතැම් වර්ග වල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධාරින්ට විශේෂ අනුග්‍රහය සහ ඒ පිළිබද කොන්දේසි<br>XXIV වැටුප් ණය හා අත්තිකාරම්<br>XXV වෘත්තිය සංගම්වල සාමාජිකයන්හට අනුග්‍රහ මුදල් රෙගුලාසි 124 සිට 134 දක්වා (ප්‍රශ්න 07කි. ප්‍රශ්න 04කට පිළිතුරු ලිවීම අවශ්‍යයි) |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 09

ප්‍රාථමික ශිල්පිය සේවා ගණය (PL -3 -2006 A) I වැනි ශ්‍රේණියේ අදාළ තනතුරු සඳහා නියමිත තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (8.1 ඡේදය)

1. විභාගය පිළිබඳ විස්තර

(අ) 1.විදුලි කාර්මික .2විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| තනතුරට අදාළ විෂයය දැනුම | පැය 01 ½ | 100 | 40% |

2.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

3.පවත්වනු ලබන බලධාරියා : මධ්‍යම පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4.විෂය නිර්දේශය

(අ ) 1.විදුලි කාර්මික 2. විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| තනතුරට අදාළ විෂය දැනුම | තනතුරට අදාළ විෂයය දැනුම රෝහල් පාලනය හා ආයතන කටයුතු පිළිබඳ දැනුම (ප්‍රශ්න 06 කි ප්‍රශ්න 04 කට පිළිතුරු ලිවීම අවශ්‍යයි) |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

## ඇමුණුම - 10

### සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම

(දැනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ)

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගත් දිනයේ සිට මෙම පරිපාටිය ක්‍රියාත්මක වේ. එම දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) මගින් ලබාදී ඇති PL – 03 – 2006 (A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන මෙහි සඳහන් සේවකයින් සියලු දෙනාම නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ලබා සිටි PL – 03 – 2006 (A) වැටුප් පරිමාණයේ අදාළ ශ්‍රේණිය/ සේවා කාලය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ වැටුප් සකස් කිරීමේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ ශ්‍රේණියට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ඊළඟ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

01. PL-3- III ශ්‍රේණිය

අ. PL – 03 – 2006 (A) වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්,

ආ. ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින් PL – 03- III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

02. PL-3- II ශ්‍රේණිය

අ. PL – 03 – 2006 (A) වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු විස්සක (20) කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්,

ආ. PL – 03 – 2006 (A) වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්,

ඇ. ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය (09) ක් සම්පූර්ණ වුවද, නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින් PL–03- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

03. **PL-3- I ශ්‍රේණිය**

අ. ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු තිහක (30) කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක විස්ස (20) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

ආ. ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු දහනවය (19) කට අඩු සේවා කාලයක් ඇති, එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්,

ඇ. PL – 03 – 2006 (A) වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවය (09) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්,

ඈ. ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09) ක් සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින් PL–03- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

04. **PL-3- විශේෂ ශ්‍රේණිය**

අ. ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු තිහක (30) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක තිහ (30) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

ආ. ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහනවය (19) ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක දහනවය (19) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්,

ඇ. ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවය (09) ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක නවයක් (09) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්,

ඈ. PL – 03– 2006 (A) වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන සේවකයින් PL–03- විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-09-30 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්